"යහපාලනය තුළින් විශිෂ්ය වූ පළාත් පාලනයක්"
"நல்லாட்சியினூடாக மேன்மையான உள்ளூராட்சி"
"Excellence in Local Governance through Good Governance"

පළාත් පාලන දෙපාර්තමේන්තුව - ඌව පළාත
මාටින් සිල්වා මාවත - බදුල්ල
உள்ளூராட்சித் திணைக்களம் - ஊவா மாகாணம்
மார்டின் சில்வா மாவத்த - பதுளை
Department of Local Government – Uva Province
Martin Silva Mawatha - Badulla

පළාත් පාලන කොමසාරිස් / உள்ளூராட்சி ஆணையாளர் / Commissioner of Local Government } 055-2231699
කාර්යාලය / அலுவலகம் / Office } 055-2222363
ෆැක්ස් / தொலைநகல் / Fax } 055-2222055
විද්‍යුත් ලිපිනය / மின்னஞ்சல் / E-Mail } clguva@gmail.com
වෙබ් ලිපිනය / இணையத்தள முகவரி / Web Address } http://clguva.com/web

මගේ අංකය / எனது இல. / My Reference } 12/01/09
ඔබේ අංකය / உமது இல. / Your Reference }
දිනය / திகதி / Date } 2019.08.28

පළාත් පාලන සහකාර කොමසාරිස් බදුල්ල/මොණරාගල
නාගරික කොමසාරිස් බදුල්ල/බණ්ඩාරවෙල
නාගරික ලේකම් නගර සභාව-හපුතලේ
ඌව පළාතේ සියළුම පළාත් පාලන ආයතනයන්හි සභා ලේකම්වරුන්

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ එම දෙපාර්තමේන්තුවට අයත් පළාත් පාලන ආයතනයන්හි කාර්යාල සේවක සේවයේ III/ II වන පන්තියේ සේවකයින් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2019**

ඌව පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති ආයතනයන් වල සේවය කරන ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ III/II වන පන්තියේ තනතුරු දරණ සේවක මහත්ම මහත්මීන් සඳහා 2001.11.26 දිනට අනුමත ඌව පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ හි විධිවිධානයන්ට අනුකූලව, පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට ඉදිරිපත් විය හැක්කේ මේ සමඟ අමුණා ඇති උපලේඛන 1 හි ඇතුළත් කාර්යාල සේවක සේවයෙහි තනතුරුවල ස්ථිර පත්වීම් ලබා ඇති සේවකයින් සඳහා පමණි.

03. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ඌව පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් බදුල්ල නගරයේදී පමණක් පවත්වනු ලබන අතර, පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් මා විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් මා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයින්ට සිදුවනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය පරීක්ෂණයකට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

04. මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සේවකයින් මෙම නිවේදනයේ ඇමුණුම 01 හි ආදර්ශ අයදුම්පත අනුව ඒ -4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් එහි අංක 01 සිට 03 දක්වා තොරතුරු පළමු පිටුවට ද, 04 සිට 07 දක්වා තොරතුරු දෙවන පිටුවට ද, ඉතිරිය තෙවන පිටුවට ද ඇතුළත් වන සේ ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතු අතර, අදාළ අයදුම්පත තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව 2019.09.10 දිනට පෙර ***පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, මාටින් සිල්වා මාවත බදුල්ල.*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. ලිපිකවරයේ වම් පස ඉහළ කෙවරේ "ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ එම දෙපාර්තමේන්තුවට අයත් පළාත් පාලන ආයතනයන්හි කාර්යාල සේවක සේවයේ III/II වන පන්තියේ සේවක මහත්ම මහත්මීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය -2019" ලෙස සඳහන් කළයුතුය.

05. සියළුම අයදුම්කරුවන් පරීක්ෂණ දිනයේ දී තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

06. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා අවම වශයෙන් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 40% ක් වත් ලබා ගත යුතුය. විභාග අපේක්ෂකයින්ගේ දැන ගැනීම සඳහා විෂය නිර්දේශයන් උපලේඛන 2 හි සඳහන් කර ඇත.

07. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට අවම වශයෙන් සති දෙකකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් ඒ බව මා වෙත ලිඛිතව දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහතික කල ඡායා පිටපතක් ද, ලිපිය ලියාපදිංචි කල අංකය ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඔබගේ ඉල්ලීම තම ආයතන ප්‍රධානියා මඟින් ලිපියකින් මෙම දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායිවනු ඇත.

08. තව ද, ඉහත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ඔබ ආයතනයේ නොමැති නම්, ඒ බව ද 2019.09.10 දිනට පෙර මා වෙත දන්වා එවීමට කටයුතු කරන ලෙසත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පරීක්ෂණය ප්‍රමුඛ කාර්යයක් සේ සළකා කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

(ටී.ගජේන්ද්‍රන් කුමාර්)
පළාත් පාලන කොමසාරිස් - ඌව (වැ.බ)

**<u>උසව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ එම දෙපාර්තමේන්තුවට අයත් පළාත් පාලන ආයතනයන් හි කාර්යාල සේවක සෙවාවන් හි III /II වන පන්තියේ සේවකයින් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2019</u>**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ඔබ විභාගයට ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය (සිංහල 01/දෙමළ 02) [ ]

ශ්‍රේණිය III/II) :- [ ]

01. නම :-

01.01:- මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම:-Mr/Mrs/Miss ........................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- PERERE A.B.C

01.02 මුලකුරු සමඟ නම :- ..................................................................................

(සිංහලෙන් /දෙමළෙන්)

01.03 මුලකුරු වලින් හැඳින්වෙන නම :- ..............................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

01.04 මුලකුරු වලින් හැඳින්වෙන නම්:- ..............................................................................................

01.05 ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................................................................

02. සේවා ස්ථානය :- ................................................................................................

02.01 ආයතනයේ නම හා ලිපිනය:-(ඉංග්‍රීසි කැපිටල්අකුරෙන්) ........................................................

..........................................................................................................................................

..........................................................................................................................................

02.02 ආයතනයේ නම ලිපිනය:- (සිංහලෙන්/දෙමළෙන්) ;- ..........................................................

..........................................................................................................................................

..........................................................................................................................................

02.03 පෞද්ගලික දුරකථන අංකය;- ......................... රාජකාරි දුරකථන අංකය:-...........................

03. ස්ත්‍රී/පුරුෂ භාවය:-ස්ත්‍රී/පුරුෂ [ ] (අදාළ කොටුව තුල ලියන්න)

**04.** **ඔබ ඉදිරිපත් වන විෂය/විෂයයන්**
**(උපලේඛන 2 සඳහන් අන්දමට)**

**05.** **දැනට දරණ තනතුර හා එම තනතුර අයත් පන්තිය**

05:01 දැනට දරණ තනතුරට අයත් සේවය හා පන්තිය ;- .................................................
(විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ එම දෙපාර්තමේන්තුවට අයත් පළාත් පාලන ආයතනයන් හි කාර්යාල සේවක සේවාවන්හි III/II වන පන්තියේ තනතුරක් වීම අනිවාර්ය වේ. )

05:02 එම තනතුරට පත් වූ දිනය:-.....................................................................................
05.03 එම තනතුරට පත් වූ ලිපියේ අංකය හා දිනය:-...................................................

**06.** **අයදුම්කරුගේ සහතිකය:-**

06;01 ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්,ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරමි. පරීක්ෂණය සම්බන්ධයෙන් ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන තීරණ වලට හා විභාග පනතේ සියළු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිබඳව මම එකඟ වෙමි.

.....................................................................

දිනය;.......................................                    අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන

---

07. අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................මහතා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය මාගේ කාර්යාලයේ .................................................. තනතුරක සේවය කරන බවද ඔහු/ඇය ............................................................ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය :-..........................................                    ................................................

අත්සන සහතික කරන්නාගේ අත්සන

සහතික කරන ලද නිලධාරියාගේ නම:-.........................................................................................
තනතුර :- .......................................................................................
ලිපිනය :- .......................................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**08.** **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

I. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,එවූ තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත්,

II. සේවක මහතා/සේවක මහත්මිය මෙම විභාගයට පෙනී සිටි/නොසිටි බවත්.

III. සේවක මහතා/සේවක මහත්මිය ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හා එම දෙපාර්තමේන්තුවට අයත් පළාත් පාලන ආයතනයන්හි කාර්යාල සේවක සේවාවන්හි III/II වන පන්තියේ තනතුරක සේවය කරන බවත්, මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු/නුසුදුසු බවත්,මම සහතික කරමි.

දිනය:- ............................ ....................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

| | |
|---|---|
| **II පන්තිය** | කාර්යාල කාර්ය සහායක<br>බයිසිකල් පණිවුඩකරු<br>සෝපාන යන්ත්‍ර ක්‍රියාකරු<br>පණිවුඩකරු<br>කාර්යාල මුරකරු |
| **III පන්තිය** | කාර්යාල කම්කරු<br>අමදින්නා<br>උද්‍යාන කම්කරු<br>සනීපාරක්ෂක කම්කරු |

උපලේඛන 02

<u>කාර්යාල සේවක සේවයේ තුන්වන පන්තියට හා දෙවන පන්තියට පත්වීම් ලද සේවක මහත්ම මහත්මීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය</u>

| විෂය | ලකුණු |
|---|---|
| කාර්යාල සේවක සේවයේ ඒ ඒ පන්තිවලට අදාළ කාර්යාල ක්‍රම හා විෂය පිළිබඳ දැනුම | 40 |
| පැමිණීම/වැඩ/හැසිරීම | 60 |
| එකතුව | 100 |

(සාමාර්ථය සඳහා අවශ්‍යා මුළු ලකුණු ප්‍රමාණය 40% කි)